# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2252/9 - 2021 නොවැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2021.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්ති යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩඉරිඟු (රේගු සංකේතාංක 1005.90) උපරිම වශයෙන් මෙ. ටොන් 2000 ක් වූ ප්‍රමාණයක් රජයට අයත් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය වෙත පමණක් ආනයනය කිරීමට සහ ඒ සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ අංක 2228/3 සහ 2021 මැයි මස 17 වැනි දිනැති *ගැසට් නිවේදනය* මගින් අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1 ක් අයකරගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය, 2021 නොවැම්බර් මස 03 වැනි දින සිට මාසයක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5595 — 485(2021/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.